# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## නීති කොමිෂන් සභා (සංශෝධන)

**1969 අංක 03 දරන නීති කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2016 අගෝස්තු මස 09 වන දින
ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 මැයි මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[126 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 010117—475 (2016/08)

## *නීතිය බලපෑමේ ප්‍රකාශය*

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ නීති කොමිෂන් සභාවේ සංයුතිය වෙනස් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ "කොමසාරිස්වරයා" යන නිල නාමය "කොමිෂන් සභාවේ සාමාජික" ලෙස වෙනස් කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ "අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා" යන නිල නාමය "අමාත්‍යාංශයේ ලේකම්වරයා" ලෙස වෙනස් කිරීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

## නීති කොමිෂන් සභා (සංශෝධන)

එල්.ඩී.—ඕ. 52/2015

**1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2016 අංක දරන නීති කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 1978 අංක 11 දරන පනතින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

1969 අංක 3 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නීති කොමිෂන් සභාව පිහිටුවීම සහ එහි සංයුතිය.

2. (1) නීති කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් :—

(i) අධිකරණ විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ ධුරයට අඩු නොවන ධුරයක් දරනු ලබන ඔහුගේ නාමිකයකු ;

(ii) නීතිපතිවරයා විසින් නම් කරනු ලබන අතිරේක සොලිසිටර් ජනරාල්වරයකුගේ ධුරයට අඩු නොවන ධුරයක් දරනු ලබන නිලධරයකු ; සහ

(iii) නීති කෙටුම්පත් සම්පාදකවරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයකුගේ ධුරයට අඩු නොවන ධුරයක් දරනු ලබන ඔහුගේ නාමිකයකු ; සහ

(ආ) (මෙහි මින්මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) බහුතරය අධිකරණ නිලධරයන් වශයෙන් සේවය කර ඇති හෝ සේවය කරනු ලබන හෝ නීතිඥවරුන් වශයෙන් හෝ නීති ගුරුවරුන් වශයෙන් පළපුරුද්දක් ඇති හෝ නීතිය පිළිබඳ අධ්‍යයන සුදුසුකම් ඇති තැනැත්තන් විය යුතු එකී පත් කිරීම සඳහා යෝග්‍ය සුදුසුකම් සහිත බවට ජනාධිපතිවරයාට පෙනී යන තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන දස දෙනෙකුට නොඅඩු සහ දහතර දෙනෙකුට නොවැඩි වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවක්.

2. කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

3. පත් කරගනු ලැබූ සාමාජිකයා කලින් ධුරය හිස් කරනු ලබයි නම් මිස, ඔහුගේ පත්වීම කරනු ලබන අවස්ථාවේ දී ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි අවුරුදු පහක් නොඉක්මවනු ලබන කාලයක් සඳහා ධුර දරනු ලැබිය යුතු අතර, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු වන්නේ ය :

එසේ වුව ද, පත් කළ යම් සාමාජිකයකු ස්වකීය ධුර කාලය අවසන්වීමට පෙරාතුව ධුරය හිස් කරනු ලබයි නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

4. පත් කළ සාමාජිකයකු ජනාධිපතිවරයා අමතා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

5. මුදල් විෂය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ පූර්ව එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික එම කොමිෂන් සභා සාමාජිකයන්ගේ සේවා සඳහා ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ "යම් කොමසාරිස්වරයකු" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ "අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා" යන වචන වෙනුවට "අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ " කොමසාරිස්වරුන්" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ යම් සාමාජිකයන් " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "කොමසාරිස්වරයා" යන අර්ථ නිරූපණය ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.